# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

**කතෝලික ධර්මය** **කාලය :පැය 2 යි**

## 1 කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින්ඉරක් අදින්න.**

(1) නව ගිවිසුමේ සඳහන් වන්නේ,
1/. ක්‍රිස්තුන් වහන්සේ හා මුල් සභාව පිළිබඳ වය. 2/. ඊශ්‍රායෙල් ජනතාවගේ වහල් පිළිබඳවයි
3/. ආදි පියවරු පිළිබඳවයි 4/ දිවැසිවරුන්ගේ මෙහෙවර පිළිබඳවයි

(2) මෝසෙස් තුමා දස පනත් ලබා ගැනීමට පෙර යාච්ඤා කළ දින ගණන වන්නේ,
1/. 40කි 2/. 30 කි 3/. 20කි 4/ 10 කි

(3) සෙකරියස් තුමාගේ පූජාව පිළිබඳ සඳහන් කරමින් ශුභාරංචිය ආරම්භ කරන ශුභාරංචි කතුවරයා වන්නේ,
1/. ශු. මාක් තුමා 2/ ශු. ලූක් තුමා 3/ ශු. මතෙව් තුමා 4/ ශු. ජොහන් තුමා

(4) ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට පැමිණියේ ,
1/ පව්කරුවන්ට දඬුවම් දීමටය 2/ ප්‍රාතිහාර්ය කිරීමට ය
3/ තම බලය පෙන්වීමට ය 4/ මිනිසාට ගැලවීම ලබා දීමටය

(5) දේව ප්‍රසාධ නිධාන ගණන වන්නේ
1/ 10 කි 2/ 7 කි 3/ 6 කි 4/ 12 කි.

(6) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධානයකි.
1/ රෝගීන්ගේ ආලේපය 2/ අභිවෘද්ධි ආලේපය 3/ ආශීර්වාදකාර බන්ධනය 4/ දිව්‍ය සත්ප්‍රසාදය

(7) දිව්‍ය සත්ප්‍රසාදය දේව ප්‍රසාද නිධානය මගින්
1/ අප රෝගී වූ විට මානසික සුවය ලබා දේ 2/ දේව ජනතාවට සේවය සඳහා අපව කැඳවයි
3/ අප තුළ ඇති පාප වලට සමාව ලැබේ 4/ කිතුනු දිවිය සඳහා අවශ්‍ය ආධ්‍යාත්මික පෝෂණය ලැබේ.

(8) ඔබ යමෙකුගේ ........................................... කමා කරන්නාහු ද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ.
මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ
1/ දුක 2/ පව් 3/ පසුතැවීම 4/ කරදර

(9) අපේ ශරීර සෞඛ්‍ය රැක ගැනීම ගැන අපට මතක් කර දෙන දේව පනත වන්නේ,
1/ 5 වන පනතයි 2/ 4 වන පනතයි 3/ 6 වන පනතයි 4/ 7 වන පනතයි

(10) අපට ජීවිතයේ කිහිපවරක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයකි.
1/ ප්‍රසාද ස්නාපනය 2/ පූජකවරය 3/ අභිවෘද්ධි ආලේපය 4/ රෝගීන්ගේ ආලේපය

(11) දෙවියන් වහන්සේ මිනිසාට දස පනත දානය කරන ලද්දේ,
1/ යහපත් ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීමට ය 2/ ධනය රැස් කිරීමට කියා දීමටය.
3/ රට තුළ සාමය ගොඩනැගීමටය 4/ තම ජීවිතය පමණක් දියුණු කර ගැනීමටය

(12) දොළොස් වයසේදී ජේසු කුමරු ජෙරුසලමට ගියේ කුමන මංගල්‍යය සැමරීම සඳහාද?
1/ පාස්කු මංගල්‍යය 2/ පෙන්තකොස්ත මංගල්‍යය
3/ කුඩාරම් මංගල්‍යය 4/ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය

(13) සියලු කාරණා වලදී .................................... කීකරු වන ලෙස කෙලොස්සි ලිපියේ සඳහන්වේ.
මෙහි හිස්තැනට අදාළ වචනය වන්නේ
1/ දෙමාපියන් ට 2/ පූජාප්‍රසාදිතුමන්ලාට 3/ ගුරුවරුන්ට 4/ කන්‍යාසොයුරියන්ට

(14) දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන නොදිවුරීමට අපට නියම වන දේව පනත වන්නේ,
1/ 3 වන දේව පනත 2/ 1 වන දේව පනත 3/ 4 වන දේව පනත 4/ 2 වන දේව පනත

(15) සේනාකුළු ශාලාවේ බියෙන් සැඟවී සිටි ගෝලයන් මත ශුද්ධාත්මයාණන් පැමිණි බවට සංකේතයක් වන්නේ,
1/ හිස මත ගිනි දලු පිහිටීම
2/ දේව දූතයන් වැඩම කිරීම
3/ දෙවිදුන්ගේ කට හඬ ඇසීම
4/ ශුද්ධාත්මයාණන් පරවියෙකු ලෙසින් පෙනී සිටීම

(16) ශුද්ධාත්ම වරම් ලබා පරිණත කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමේ වගකීම අපට පැවරෙන දේව ප්‍රසාද නිධානය වන්නේ
1/ අභිවෘද්ධි ආලේපය 2/ ප්‍රසාද ස්නාපනය 3/ ආශීර්වාදකාර බන්ධනය 4/ රෝගීන්ගේ ආලේපය

(17) දෙවියන් වහන්සේ මිනිසාව මවන ලද්දේ
1/ දේව ස්වරූපයට හා දේව සමානකමට ය
2/ ස්ත්‍රිය තනිව සිටීම සුදුසු නැති නිසාය
3/ ශරීරය හා ආත්මය නොමැතිවය
4/ දේව මැවිල්ලට සමානවය

(18) ස්නාවක ජුවාම් තුමාගේ දෙමාපියන් වන්නේ,
1/ මරියා හා ජෝශප් ය
2/ ආබ්‍රහම් හා සාරා ය
3/ හන්නා හා එල්කානා ය
4/ එළිසබෙත් හා සෙකරියස් ය

(19) පාපය නිසා රෝගී වන අපගේ ආත්මය නැවතත් සුවපත් කරන දේව ප්‍රසාද නිධානය වන්නේ,
1/ ප්‍රසාද ස්නාපනය 2/ ආශීර්වාදකාර බන්ධනය 3/ සමගිවීමේ දේව ප්‍රසාද නිධානය 4/ දිව්‍ය සත්ප්‍රසාදය

(20) දෙවියන් වහන්සේ පස් වන දිනයේ මවන ලද්දේ,
1/ ගොඩබිම හා ගස්කොළන් 2/ ඉර , හඳ , තාරකා 3/ අහස හා ජලය 4/ පක්ෂීන් හා සතුන්

(ලකුණු 2X20=40)

## ------------------------------------------2 කොටස------------------------------------------

**<u>පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.</u>**

1/
i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ කවදාද? කවුරුන් විසින්ද?
ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සම්බන්ධයෙන් සිදුව ඇති ප්‍රාතිහාරයක් නම් කරන්න.
iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගැනීමට අප සූදානම් වන ආකාර දෙක නම් කරන්න.
iv. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගත් ඔබ කළ යුතු ක්‍රියාවන් දෙකක් ලියන්න.
v. දිව්‍ය සත්ප්‍රසාදයේ ජීවමානව වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඔබේ ගෞරවය පුද කිරීමට කළ හැකි කාර්යයන් 2 ක් ලියන්න.

(ලකුණු 4X5=20)

2/
i. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
ii. පංච පුස්තකයට අයත් කෘතීන් දෙකක් නම් කරන්න.
iii. ඔබට අන් අය වෙනුවෙන් කළ හැකි උපකාර 5 ක් ලියන්න.

(ලකුණු 2+3+5+= 10)

3/
i. ආශීර්වාදකාර බන්ධනය දේව ප්‍රසාද නිධානය දානය කරන්නේ කවුද?
ii. පූජාප්‍රසාදීන් වහන්සේලා ඉටු කරන සේවාවන් 3 ක් ලියන්න.
iii. ඔබේ පවුලේ එකමුතුකම ආරක්ෂා කර ගැනීමට කළ හැකි ක්‍රියාවන් 5 ක් ලියන්න

(ලකුණු 2+3+5+= 10)

4/ i දේව මැවිල්ලෙන් මිනිසාට ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න
ii දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීමට කළ හැකි දේවල් 3 ක් ලියන්න
iii දෙවි පියා අපට ලබා දුන් ලස්සන දේව මැවිල්ල ගැන තුති පුදමින් යැදුමක් ලියන්න

(ලකුණු 2+3+5+= 10)

5/
i. දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම දැක්වෙන දේව පනත් 2 ක් ලියන්න
ii. ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට කළ හැකි දේවල් 3 ක් ලියන්න
iii. අන් අය වෙනුවෙන් අප ඉටු කළ යුතු කාර්යයන් දැක්වෙන දේව පනත් 5 ක් ලියන්න

(ලකුණු 2+3+5+= 10)

6/
i. රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 2 ක් ලියන්න
ii. රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 3 ක් ලියන්න.
iii. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවැසි පියවර 5 ක් ලියන්න.

(ලකුණු 2+3+5+= 10)